www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය මහ මැතිවරනයට තරඟ කරයි

## Socialist Equality Party to stand in Sri Lankan elections

**සමාජවාදී සමානතා පක්ෂය විසිනි**

**2004 මාර්තු 02**

---

ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය (සසප) අප්‍රේල් 2 දා පැවැත්වීමට නියමිත මහ මැතිවරනයේ දී කොලඹ දිස්ත්‍රික්කයට අපේක්ෂකයන් 23ක ලැයිස්තුවක් ඉදිරිපත් කරමින් තරග වදී. මෙය රටේ ජනාකීර්න ම දිස්ත්‍රික්කය ද කාර්මික හා වානිජ මධ්‍යස්ථානය ද වෙයි.

අපේක්ෂක කන්ඩායමට නායකත්වය දෙන්නේ *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ සාමාජිකයකු වන සසප ප්‍රධාන ලේකම් විජේ ඩයස් ය. සෙසු සසප අපේක්ෂකයන් අතරට සිංහල හා දෙමල යන ජනවර්ග දෙකටම අයත් කාර්මික කම්කරුවන්, ගුරුවරුන්, බැංකු සේවකයන්, ශිෂ්‍යයන් හා රැකියා විරහිත තරුනයෝ අයත් වෙති.

සසප විසින්, මැතිවරනය යොදාගනු ලබන්නේ, කම්කරු පන්තිය මුහුන දෙන බැරෑරුම් අන්තරායන් සම්බන්ධයෙන් අනතුරු ඇඟවීමත් එම අන්තරායන්ට එරෙහිව සටන් වැදීමට අවශ්‍ය දේශපාලන ක්‍රියාමාර්ගය පිලිබඳ පුලුල් සාකච්ඡාවක් විවෘත කිරීමත් පිනිස ය.

කම්කරුවන් ඉදිරියේ පවත්නා කේන්ද්‍රීය ගැටලුව නම්, දැනටමත් ජීවිත 60,000කට වඩා බිලිගෙන ඇති ව්‍යසනකාරි සිවිල් යුද්ධයට රට යලි ඇද වැටීමේ වැඩෙන තර්ජනයයි. එක්සත් ජාතික පෙරමුනු (එජාපෙ) ආන්ඩුව බලයට පැමින, දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය සමග සටන් විරාම ගිවිසුමක් අත්සන් කිරීමෙන් වසර දෙකක් ගතවන විට, ඊනියා සාම ක්‍රියාදාමය මුලුමනින් ම ඇනහිට ඇත.

මහ ව්‍යාපාරිකයන් සහ ප්‍රධාන බලවත්තු, දිවයින ලාභ ශ්‍රම වේදිකාවක් බවට පරිවර්තනය කරනු පිනිස, එල්ටීටීඊය සමග සාම ගිවිසුමකට එලඹෙන ලෙස බල කරමින් සිටිති. එහෙත් "සාම ක්‍රියාදාමය" හේතු භූත වී ඇත්තේ, සමාජ ආතතීන් අපසරනය කිරීමේත් වැඩ කරන ජනයා ජනවාර්ගික, භාෂාමය හා ආගමික රේඛා ඔස්සේ භේද කිරීමේත් දේශපාලන අවියක් ලෙස, දෙමල විරෝධී ස්වෝත්තමවාදය මත නිරතුරුවම පාදක වී ගත්, කොලඹ රාජ්‍යය සහ දේශපාලන සංස්ථාපිතය තුල, ගැඹුරු බෙදීම් අවුලුවාලීමට යි.

ආරම්භයේ පටන්ම, සමස්ත "සාම ක්‍රියාදාමය", රාජ්‍ය යන්ත්‍රනයේ කොටස්වල, විශේෂයෙන් ම මිලිටරියේ, සහ ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) වැනි සිංහල අන්තවාදී කන්ඩායම්වල නිරන්තර ප්‍රහාරයට ලක් විය. ඔවුන් එල්ටීටීඊය සමග ඇති කර ගැනෙන ඕනෑම එකඟතාවක් හඳුන්වන්නේ ද්‍රෝහී ක්‍රියාවක් ලෙස ය.

එජාපෙ ආන්ඩුව එල්ටීටීඊය සමග ගෙන ගිය සාකච්ඡාවල දී නොමනා සහන දුන් බවටත් "ජාතික ආරක්ෂාව" අනතුරේ හෙලූ බවටත් ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග එල්ල කල හෙලා දැකීම්වල දී, ඇය වඩවඩා පදනම් වී ගත්තේ මෙම ස්ථර මත ය. ඔවුන්ගේ ඉල්ලීම මත, ඇය, පසුගිය නොවැම්බරයේ දී, ආරක්ෂක අමාත්‍යාංශය ඇතුලු මූලික අමාත්‍යාංශ තුනක් හිතුවක්කාරී ලෙස තමන්ට පවරාගත් අතර, පෙබරවාරි 7 දා, පෙර නොවූ විරූ පියවරක් තබමින්, ඡන්දයෙන් තේරී පත් වූ ආන්ඩුව බලයෙන් පහ කලේ ය.

කුමාරතුංගගේ ක්‍රියාවන් තුඩු දී ඇත්තේ විවිධ සිංහල අන්තවාදී කන්ඩායම් දිරිමත් කිරීමට ය. දැන් ජනාධිපතිනියගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) සමග නිල සන්ධානයක සිටින ජවිපෙ, සාමාන්‍ය වැඩ කරන ජනතාව තමන් මුහුන දෙන මංමුලාසහගත කොන්දේසිවලින් අපසරනය කරනු වස්, ජාතිවාදය ඇවිලවීමට මෙම අවස්ථාව ගසාකෑමේ යෙදී සිටී. මේ අතර, බෞද්ධ භික්ෂූන් 260ක්, විශේෂයෙන් ම, එල්ටීටීඊය සමග මොන යම් හෝ සාකච්ඡාවක් පැවැත්වීමට එරෙහි වීමත් රට බෞද්ධ ධර්ම රාජ්‍යයක් බවට පරිවර්තනය කිරීම මගින් "ජාතිය ගලවා ගැනීමත්" පිනිස කැපවූ බැව් කියන, ජාතික හෙල උරුමය ලෙස යලි නම් කෙරුනු, අන්ත දක්ෂිනාංශික සිහල උරුමයේ ධජය යටතේ, මැතිවරනයට ඉදිරිපත් වී සිටිති.

තමන් වත්මන් සටන් විරාමයට ගරු කරන බවත් එල්ටීටීඊය සමග සාකච්ඡා කිරීමට සූදානම් බවත් කුමාරතුංග සහ ඇගේ දේශපාලන සගයෝ කියා සිටිති. එහෙත්, "සාම ක්‍රියාදාමය" පිලිබඳ ඔවුන්ගේ හෙලා දැකීම්වලට ඒවාටම ආවේනික නොවැලැක්විය හැකි තර්කනයක් පවතී. සිංහල ස්වෝත්තමවාදී වාචාල ප්‍රචාර මගින් විස ගැන්වීමෙන් දේශපාලනිකව ගිනියම් වූ වාතාවරනයක්, මැතිවරනයේ ක්ෂනික ප්‍රතිඵලය කුමක්

වුවත්, අවි ගැටුම යලි ඇරඹීම සඳහා තතු සකසයි.

ඡන්දයෙන් තේරී පත්වූ ආන්ඩුවක් බලයෙන් පහ කිරීමට ජනාධිපතිනි ගත් තීන්දුව මගින් පෙන්නුම් කෙරෙන්නේ, නව ආඥාදායක පාලන රූපයන් සූදානම් කෙරෙන අතරතුර පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය වඩවඩා පසෙකට අතුගා දැමෙන බව යයි සසප අනතුරු අඟවා සිටී. එජාපෙ ඇතුලුව, දේශපාලන සංස්ථාපිතයේ කිසිදු කොටසක් වෙතින් කුමාරතුංගගේ ක්‍රියාවට විරුද්ධත්වයක් මතු නො වීම මගින් සලකුනු කෙරෙන්නේ, මූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන්ගේ ආරක්ෂාව බැරෑරුම්ව තකන කිසිදු කොටසක් පාලක කවයන් අතර නැති බවයි.

ජනාධිපතිගේ ඒකාධිපති විධික්‍රම, අන් සියල්ලටමත් වඩා, එල්ල කෙරෙන්නේ, කම්කරු පන්තියට එරෙහිව ය. එකදු ප්‍රධාන පක්ෂයක් වත්, ජනගහනයේ බහුතරයේ මූලික අවශ්‍යතා හා අභිලාෂයන් සපුරාලීමෙහි ලා අසමත් ය. ජවිපෙ ඇතුලු ඔවුන් සියල්ලෝ ම, ජීවන මට්ටම් පහත දමමින්, සමාජ අසමානතාව දැවැන්ත ලෙස තීව්‍ර කොට ඇති, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ හා ලෝක බැංකුවේ ආර්ථික ප්‍රතිව්‍යුහගත කිරීමේ න්‍යාය පත්‍රය ක්‍රියාවට දැමීමට කැප වී සිටිති. රට යලි යුද්ධය කරා ඇද වැටීමක්, වැඩ කරන ජනයාට සමාජ ව්‍යසනයක් වනු ඇත. ජීවිත දසදහස් ගනනක් බිලිගත්, ඊටත් වඩා වැඩි සංඛ්‍යාවක් අංගඡේදනයට ලක්කොට, ලක්ෂ සංඛ්‍යාත ජනකායක් දරිද්‍රතාවේ ගිලුනු සරනගතයන් බවට පත් කල, යුද්ධයේ බර දැරීමට බල කෙරුනේ වැඩ කරන ජනයාටයි.

## යුද්ධයට එරෙහි වනු! උතුරෙන් හා නැගෙනහිරෙන් සියලු හමුදා ඉවත් කරනු!

සසප, අප්‍රේල් 2 දා මැතිවරනයේ දී, යුද්ධය අවසන් කිරීමේ, ප්‍රජාතන්ත්‍ර අයිතීන් ආරක්ෂා කිරීමේ හා සාමාන්‍ය වැඩ කරන ජනයා මුහුන දෙන ගැඹුරු වන සමාජ අර්බුදය විසඳාලීමේ සමාජවාදී ක්‍රියාමාර්ගය ඉදිරිපත් කරයි. සසප (සහ එහි පූර්වගාමී විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය), 1983 දී යුද්ධය පිපිරීමේ පටන් මේ දක්වාම යුද්ධයට ක්ෂමා විරහිතව විරුද්ධ වූ ද අනුප්‍රාප්තික කොලඹ ආන්ඩුවලට එරෙහිව සිංහල හා දෙමල ජනයාගේ එකමුතුව සඳහා සටන් වැදුනා වූ ද එකම පක්ෂයයි.

වත්මන් දේශපාලන අර්බුදය පෙන්නුම් කරන පරිදි, පාලක පන්තිය, ප්‍රගතිශීලී පදනමක් මත යුද්ධය අවසන් කිරීමෙහි ලා සිය පරිපූර්න නො හැකියාව ඔප්පු කර ඇත. එක්සත් ජාතික පක්ෂය හා ශ්‍රීලනිපය යන දෙපාර්ශ්වයම, යුද්ධයට හේතු වූ සිංහල ජාතිවාදය තුල ගැඹුරින්ම ගිලී සිටින අතර යුද්ධය කුරිරු ලෙස ඉදිරියට ගෙනයාම සම්බන්ධයෙන් ද වගකිව යුතු ය. පැරනි "කම්කරු" සංවිධාන — ලංකා සමසමාජ පක්ෂය සහ කොමියුනිස්ට් පක්ෂය — දශක ගනනාවක් තිස්සේ ස්වෝත්තමවාදී දේශපාලනයට අනුගත වෙමින් අවුත් දැන් ජවිපෙ-ශ්‍රීලනිප සන්ධානයේ කොටස්කරුවන් බවට පත්ව තිබේ. සැබෑ සාමයත් ජාතිවාදී ගැටුම හා එදිරිවාදුකම් අවසානයකට ගෙන ඒමත් සඳහා අවශ්‍ය පූර්ව-කොන්දේසිය වන්නේ, සියලු ධනේශ්වර පක්ෂවලින්ද, ඔවුනගේ විවිධාකාර ක්ෂමාලාපකයන්ගෙන් හා ධනේශ්වර රාජ්‍යයෙන් ද කම්කරු පන්තියේ දේශපාලන ස්වාධීනත්වය තහවුරු කිරීමයි.

වික්‍රමසිංහගේ හා එජා පෙරමුනේ ඊනියා සාම ක්‍රියාදාමය හෝ පොරොන්දු පිලිබඳව කම්කරුවන්ට කිසිදු විශ්වාසයක් තැබිය නො හැකි ය. මහ ව්‍යාපාරිකයන්ගේ හා මහ බලවතුන්ගේ බලපෑම යටතේ, වික්‍රමසිංහ, කම්කරු පන්තිය සූරාකෑමේ ඔවුනගේ පිලිවෙත තීව්‍ර කරගැනීමේ එල්ලයෙන් යුතුව, රටේ සිංහල, දෙමල හා මුස්ලිම් ප්‍රභූ කොටස් අතර බලය බෙදාගැනීමේ එකඟතාවක රූපයෙන්, එල්ටීටීඊය සමග සාම ගිවිසුමක් ගසාගැනීමේ ප්‍රයත්නයක යෙදී සිටී.

දිවයිනේ උතුරු හා නැගෙනහිර පලාත්වලට බලය විමධ්‍යගත කිරීමේ විවිධාකාර "සාම" සැලසුම්, ස්වෝත්තමවාදය හා වර්ගවාදය අවසන් කරනවා වෙනුවට, වර්ගභේදවාදී ආතතීන් හා ගැටුම් නොවැලැක්විය හැකි බවට පත් කරමින්, ජාතිවාදී බෙදීම් සංස්ථාපිත කිරීමට පමනක් තුඩු දෙනු ඇත. ආන්ඩුව හා එල්ටීටීඊය යන දෙපාර්ශ්වයම යෝජනා කර ඇත්තේ, ප්‍රජාතන්ත්‍ර විරෝධී ලෙස කඩා පාත් කෙරෙන හා ජාතිවාදීව පදනම් වූ පක්ෂවල බලය තහවුරු කරන අන්තර් පාලනයන් ය. එල්ටීටීඊය, කොලඹ සිටින පාලකයන් මෙන් ම, විදේශ ආයෝජන සඳහා තරඟ වැදීමටත් දිවයින "ව්‍යාඝ්‍ර ආර්ථිකයක්" බවට පරිවර්තනය කිරීමටත් කැප වී සිටී.

යලි අවි ගැටුමක් කරා යාම වලකාලීමට නම්, කම්කරු පන්තිය, යුද්ධය සම්බන්ධයෙන් තමන්ගේ ම පන්ති විසඳුම ඉදිරිපත් කල යුතු ය. දිවයිනේ උතුරෙන් හා නැගෙනහිරෙන් සියලු ශ්‍රී ලංකා මිලිටරි හමුදා වහාම හා කොන්දේසි විරහිතව ඉවත් කල යුතු යයි සසප ඉල්ලා සිටී. ඒකීය රාජ්‍යය බලහත්කාරයෙන් පවත්වා ගෙන යාම සමග දෙමල සුලුතරයේ ප්‍රජාතන්ත්‍ර අයිතීන් මැඩීම සිදු කෙරී ඇතුවා පමනක් නො ව, එය දිවයින පුරා ම මිලිටරිවාදයේ ආධිපත්‍යයටත් ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට එරෙහිව මූලික ප්‍රහාරවලටත් තුඩු දී තිබේ.

## ශ්‍රී ලංකා හා ඊලම් එක්සත් සමාජවාදී සමූහාන්ඩුවක් සඳහා!

ජාතිවාදයේ හා ස්වෝත්තමවාදයේ සියලු රූපාකාරයන් තීරනාත්මකව ප්‍රතික්ෂේප කරන ලෙසත් ජනවර්ගය, භාෂාව හෝ ආගම නො තකා, සියලු දෙනාගේම ප්‍රජාතන්ත්‍ර අයිතීන් වෙනුවෙන් පෙරමුන ගෙන සටන් වදින ලෙසත්, සසප කම්කරු පන්තියෙන් ඉල්ලා සිටී. විසි අවුරුදු සිවිල් යුද්ධය සම්බන්ධයෙන් ගෙන එන ඕනෑම විසඳුමක්, ජාතිවාදය සහ කුමාරතුංග විසින් යොදාගනු ලැබෙන ඒකාධිපති බලතල ශක්තිමත් කරන, ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාව මුලුමනින් ම ප්‍රතික්ෂේප

කිරීමක් ඉල්ලා සිටී. ධනපති දේශපාලන කල්ලි වෙනුවට, සාමාන්‍ය වැඩ කරන ජනයාට, ප්‍රජාතන්ත්‍ර අයිතීන් පිලිබඳ සියලු නො විසඳුනු ගැටලු පිලිබඳ තීන්දු කිරීමේ අවස්ථාව ලබා දෙන, අව්‍යාජ නියෝජනයකින් යුක්ත, ව්‍යවස්ථා සම්පාදක මන්ඩලයක් ස්ථාපිත කිරීමට සසප සටන් වදී.

ප්‍රජාතන්ත්‍ර අයිතීන් ආරක්ෂා කිරීම, දිවයිනේ ජනගහනයෙන් බහුතරයක් මුහුන දෙන භයංකර සමාජ කොන්දේසි අවසානයක් කරා ගෙන ඒම සමග මුලුමනින් ම බැඳී පවතී. නිදහස් වෙලඳ පොල පිලිවෙත් පිලිබඳ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ හා ලෝක බැංකුවේ ඉල්ලීම් අනුගමනය කිරීම මගින්, සමාජ අර්බුදය විසඳා ගත හැකි ය යන මිථ්‍යාව, ජවිපෙ හා එල්ටීටීඊය ඇතුලු සියලු ධනපති පක්ෂ විසින් තොරොම්බල් කරනු ලැබේ. ජීවන මට්ටම් වැඩි දියුනු කරනවා වෙනුවට, මෙම න්‍යාය පත්‍රය මගින් නිර්මානය කර ඇත්තේ, ධනවතුන් හා දුගීන් අතර ගැඹුරු වන පරතරයක්, පවත්නා සමාජ සේවාවන්ට වල කැපීම හා ඒවා විනාශයට ලක් කිරීමක් සහ මූලික පොදු කාර්ය ව්‍යුහයන් තව දුරටත් පිරිහෙලීමක් ය.

මෙම දැවෙන සමාජ ගැටලු එකක් වත් ධනපති ලාභ ගැරීම් පද්ධතියේ රාමුව තුල විසඳිය නො හැකි යයි සසප අවධාරනය කරයි. සිය අරගලයන් ඒකාබද්ධ කිරීම, සියල්ලන්ගේම ප්‍රජාතන්ත්‍ර අයිතීන් ආරක්ෂා කිරීම සහ දරිද්‍රතාව හා අගහිඟකම් අවසන් කිරීමේ ස්වකීය සමාජවාදී විසඳුම ඉදිරිපත් කිරීම මගින්, කම්කරු පන්තිය, නාගරික දුගීන් හා ගම්බද ජනයා සඳහා බලගතු ආකර්ෂනීය ධ්‍රැවයක් බවට පත්ව, තමන් අතට දේශපාලන බලය දිනාගැනීම පිනිස පදනම දමාගැනීමට සමත් වනු ඇත. මෙම පදනම මත, සසප සටන් වදින්නේ, ධනවත් අතලොස්සක ලාභ අවශ්‍යතාවන් වෙනුවට, වැඩ කරන ජනයාගේ සමාජ අවශ්‍යතා ඉටු කරනු පිනිස, සමාජය ඉහල සිට පහලට ප්‍රතිසංවිධානය කිරීමේ විධික්‍රමයක් ලෙස, ශ්‍රී ලංකා හා ඊලම් එක්සත් සමාජවාදී සමූහාන්ඩුවක් ගොඩනැගීම සඳහා ය.

එක්සත් ජනපද මිලිටරිවාදයේ පුපුරා යාම සහ ලෝක ආධිපත්‍යය සඳහා එහි පවත්නා ඉව බව නැති ධාවනය තුල සිය වඩාත්ම කොල්ලකාරී ප්‍රකාශනය අත්පත් කරගන්නා වූ අධිරාජ්‍යවාදී ආධිපත්‍යයට එරෙහි අරගලයකින් තොරව, එවන් වැඩපිලිවෙලක් ගැන සිතිය නො හැකි ය. ශ්‍රී ලංකාවේ "සාම ක්‍රියාදාමයට" වොෂිංටනය දෙන සහයෝගය — ඉන්දු-පකිස්ථාන සාකච්ඡාවලට එය දෙන සහාය, ඇෆ්ඝනිස්ථානයේ වාඩිලාගැනීම සහ නේපාල රාජාන්ඩුවට ආයුධ සම්පාදනය කිරීම මෙන් ම — එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ අවශ්‍යතා ඉටු කරගනු පිනිස, දකුනු ආසියාවේ ආර්ථික හා දේශපාලන කටයුතු යලි සැකසීමේ එල්ලය සහිත, පුලුල් මූලෝපායක කොටසකි.

ඇෆ්ඝනිස්ථානයේ හා ඉරාකයේ එක්සත් ජනපද ආක්‍රමනයට එරෙහි වනවා වෙනුවට, ජවිපෙ හා එල්ටීටීඊය ඇතුලු ශ්‍රී ලංකාවේ සියලු පක්ෂ, ඒ හෝ මේ ආකාරයෙන්, වොෂිංටනයේ න්‍යාය පත්‍රයට, අනුගත වී ඇත. සසප, ඇෆ්ඝනිස්ථානයේ හා ඉරාකයේ එක්සත් ජනපද වාඩිලාගැනීම්වලට පැහැදිලිව ම විරුද්ධ වන අතර, මෙම රටවල් දෙකෙන් සියලු විදේශ හමුදා හා බලධාරීන් වහාම හා කොන්දේසි විරහිතව ඉවත් කල යුතු යයි ඉල්ලා සිටී.

සසපයේ අති මූලික පදනම, කම්කරු පන්තියේ ජාත්‍යන්තර එකමුතුවයි. ඉන්දු උප-මහාද්වීපය හා ආසියාව පුරා වෙසෙන හා නිෂ්පාදන සන්තතීන්ගේ භූගෝලීයකරනය මගින් දැවැන්ත ලෙස ප්‍රසාරනය කෙරී ඇති, කෝටි සංඛ්‍යාත කම්කරුවන්ගෙන් අප ඉල්ලා සිටින්නේ, අධිරාජ්‍යවාදයට එරෙහි ඒකාබද්ධ ප්‍රහාරයක් සඳහා, එක්සත් ජනපදයේ, යුරෝපයේ හා ලෝක පරිමානව සිටින සිය පන්ති සහෝදරසහෝදරියන් හා ඒකාබද්ධ වන ලෙසසි. පොදු ජාත්‍යන්තරවාදී ඉදිරිදර්ශනයක පදනම මත, මේ අවස්ථාවේ ම මැතිවරන උද්ඝෝෂනවල යෙදී සිටින, අපගේ සහෝදර පක්ෂ -- එක්සත් ජනපදයේ හා ජර්මනියේ සමාජවාදී සමානතා පක්ෂ -- සමග අපි උරෙනුර ගැටී සටන් වදිමු.

එලඹෙන කාල පරිච්ඡේදයේ දී, සසප, අපගේ ක්‍රියාමාර්ගය හා පිලිවෙත් තවදුර පැහැදිලි කරමින්, මැතිවරන ප්‍රකාශයක් පල කරනු ඇත. අපගේ උද්ඝෝෂනයට ක්‍රියාශීලීව සහයෝගය දෙන ලෙසත් සහභාගි වන ලෙසත් *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* සියලු පාඨකයන්ගෙන් — ශ්‍රී ලංකාවේ, ආසියාවේ හා ජාත්‍යන්තරව — අපි ඉල්ලා සිටිමු. සිංහල හා දෙමල භාෂාවලට පරිවර්තනය කෙරෙන අපගේ ප්‍රකාශය බෙදා හැරීමට සහාය දෙන්න, අපගේ ප්‍රසිද්ධ රැස්වීම්වලට සහභාගි වීමට අවශ්‍ය කටයුතු පිලියෙල කරගන්න. සසප කතිකයන් අමතන රැස්වීම් ඔබගේ වැඩ පොලේ හෝ ප්‍රදේශයේ සංවිධානය කරන්න. අපේ මැතිවරන අරමුදලට ආධාර කරන්න. අන් සියල්ලටමත් වඩා, අපගේ ක්‍රියාමාර්ගය හා ඉදිරිදර්ශනය බැරෑරුම්ව අධ්‍යයනය කොට සසප සාමාජිකත්වය ලබා ගැනීමට ඉල්ලුම් කරන්න.

© www.wsws.org